www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නල දරු උපත් ප්‍රතිකාරය සඳහා විද්‍යාඥයෙකුට නොබෙල් ත්‍යාගය පිරිනැමේ

## Scientist awarded Nobel Prize for developing IVF treatment

**ක්‍රිස් ටැල්බට් විසිනි**

**2010 ඔක්තෝබර් 13**

නල දරු උපත් සංසේචන (අයිවීඑෆ්) තාක්ෂනය වෙනුවෙන් කල පුරෝගාමී කාර්යභාරය සඳහා විශ්‍රාමික බ්‍රිතාන්‍ය ජාතික මහාචාර්ය රොබට් එඩ්වර්ඩ්ස් වෙත භෞතවේදය හෙවත් වෛද්‍ය විද්‍යාව පිලිබඳ නොබෙල් ත්‍යාගය පිරිනමා ඇත. කේම්බ්‍රිජ් සරසවියේ ජීව විද්‍යාඥයෙකු වන එඩ්වර්ඩ්ස්, බ්‍රිතාන්‍ය ජාතික නාරිවේද වෛද්‍ය පැට්රික් ස්ටෙප්ටෝ සමගින්, මානව ස්ත්‍රී ඩිම්බ ශරීරයෙන් පිටතට ගෙන පුරුෂ ජන්මානුවක් මගින් සංසේචනය කරවා ගර්භාෂය තුල තැන්පත් කිරීමේ ක්‍රමය පිලිබඳව නවීන පර්යේෂන වල නිරත විය. මැන්චෙස්ටර් නගරයට ආසන්න ඕල්ඩ්හැම් දිස්ත්‍රික් මහරෝහලේ දී අයිවීඑෆ් තාක්ෂනය යොදා ගනිමින් බිහිකල ප්‍රථම "පරීක්ෂන නල සිඟිත්තිය" බවට 1978 දී ලුවී බ්‍රවුන් පත් වූ තැන් පටන්, මිලියන 4කට වැඩි දරුවන් සංඛ්‍යාවකට උපත ලැබීමට මෙම සංසේචන ක්‍රමය ඉඩ ප්‍රස්ථා ලබා දී ඇති බව තක්සේරු කෙරේ.

ස්ටොක්හෝම්හි කැරොලින්ස්කා ආයතනය ආශ්‍රිතව පවතින නොබෙල් කමිටුව සිය නිල ප්‍රකාශනයේ එඩ්වර්ඩ්ස්ගේ ප්‍රතිපදානයන් "නවීන වෛද්‍ය විද්‍යාවේ වර්ධනයෙහි සන්ධිස්ථානයක් නියෝජනය කරතියි ද 1950 ගනන්වල ඔහුගේ පර්යේෂනය ඇරඹූ කාලය කරා දිවයන අයිවීඑෆ් තාක්ෂනය සිදුකල හැක්කක් ය යන ඔහුගේ දැක්ම දැන් යථාර්ථයක් සහ ලොව පුරා දරු උපත් බිහිකල නොහැකි පුද්ගලයන් සතුටට පත්කරන දෙයක් වී ඇතැයි" ද කියා සිටියේ ය.

දැනට 85වන වියේ පසුවන එඩ්වර්ඩ්ස්, ත්‍යාගය ලබාගැනීම සඳහා ස්වීඩනයට සංචාරය කිරීමට හෝ ස්වීඩන ක්‍රෝන මිලියන 10 (ඩොලර් මිලියන 1.5ක් පමන) ප්‍රයෝජනයට ගැනීමට නො හැකි තරමට සෞඛ්‍ය අතින් දුර්වල ය. ස්ටෙප්ටෝ 1988 දී මියගිය අතර මිය යාමෙන් පසුව නොබෙල් ත්‍යාග පිරිනැමීමක් සිදු වන්නේ නැත. ඔවුන්ගේ පර්යේෂනයට ගෞරව දැක්වීම වසර 30කටත් වඩා ප්‍රමාද වීමට හේතුව, ලෝකයේ ආගමික සංස්ථාපිතය මෙම පුරෝගාමී කර්තව්‍යයට දැක්වූ පුලුල් විරුද්ධත්වය සහ එහි ප්‍රතිඵලයක් ලෙස කිසිදු ආන්ඩුවක් අයිවීඑෆ් ප්‍රතිකාරයට හෘද්‍යාංගම සහයෝගය දීමට මැලිවීම ය. "ලුවී බ්‍රවුන් සෞඛ්‍ය සම්පන්න බවත් දැන් ස්වාභාවිකව ඇයගේ ම දරුවෙක් ලබා සිටීය යන්නත් දැකගැනීම සඳහා නොබෙල් කමිටුව බලා සිටියේ ය" යනුවෙන් සමහර විචාරකයින් දක්වන අදහස් විශ්වාසනීය නො වන අතර තාක්ෂනයේ සාර්ථකත්වය හේතුවෙන් එම අදහස්වලට විද්‍යාත්මක පදනමක් නැත.

වතිකානුවේ නිලධාරියෙක් වන, ජීවිතය සඳහා පොන්ටිෆිකල් (ආධානග්‍රාහී) ඇකඩමියේ සභාපති ඉග්නේෂියෝ කොරැස්කෝ ඩි පවුලා, නොබෙල් ත්‍යාගය පිලිබඳව කීවේ එය "සම්පූර්නයෙන් ම වැරදි තැනකට යොමු වී ඇති" බවයි. එඩ්වර්ඩ්ස්ගේ කර්තව්‍යයේ සදාචාරත්මක ගම්‍යයන් එය නො තකා හැර ඇතැයි කියමින් ඔහු මෙසේ කීවේ යඃ "එඩ්වර්ඩ්ස් නොමැතිව මානව බීජවලට වෙලඳපොලක් නො තිබෙනු ඇත. එඩ්වර්ඩ්ස් නොමැතිව යෝනි මාර්ගයකට මාරුකරනු ලැබීමේ අපේක්ෂාවෙන් පසුවන කලලවලින් පිරීගිය ශීතකරන හෝ වඩාත් වියහැකි ලෙස ඒවා පර්යේෂනවලට භාජනය කිරීම නැත්නම්, මරනයට ඇද දමා සියල්ලන් විසින් අමතක කරදැමීමක් සිදු නො වනු ඇත."

සිය වෘත්තීය ජීවිතය පුරා දරුවන් රහිත ජෝඩුවලට වැඩිපුර උදව් කිරීම වෙනුවෙන් පෙනී සිටි එඩ්වර්ඩ්ස් හට, මානව බීජ විකිනීමෙන් මුදල් සෙවීමට අවශ්‍ය වී යයි කියා සිටීම අමු අමුවේ මඩගැසීමකි. සෑම විට ම ස්වභාව ධර්මයේ සිදු වන නූපන් කලල විනාශ කිරීම, සවිඥානික මානවයන් මරාදැමීම සමගින් සමාන කරන කතෝලික පල්ලිය, අයිවීඑෆ් තාක්ෂනය පාපයක් ලෙස සලකයි. එය සාමාන්‍ය ලිංගික සබඳතාවලින් හට නොගන්නා උපත් "අස්වාභාවික" ලෙස ද සලකයි.

කම්කරු පන්තික වටාපිටාවකින් පැවත එන රොබට් එඩ්වර්ඩ්ස්, පූර්වයෙන් ගෙවීමට තරම් වත්කමක් සහිත දෙමව්පියන්ගේ දරුවන් අල්ප සංඛ්‍යාවකට පමනක් සීමා වූ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබීමට සමත් වූයේ, බ්‍රිතාන්‍ය ආන්ඩුව, දෙවන ලෝක යුද්ධයට සම්බන්ධවී ආපසු පැමිනෙන සොල්දාදුවන් වෙනුවෙන් මුදල් යෙදවීමේ අවස්ථාව හිමිකර ගැනීමෙනි. කෘෂිකර්මය සහ සත්ව විද්‍යාව

හැදෑරීම සඳහා උතුරු වේල්සයේ බන්ගෝර් සරසවියට ඇතුල් වූ ඔහු, ඉන්පසු ජාන විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය හැදෑරීමට එඩින්බර්ග් සරසවියට ගියේ ය. පරීක්ෂන නලයක් තුල පිරිමි ධාතු එකතු කිරීම මඟින් හාවුන්ගේ ප්‍රජනන බීජ සංසේචනය කල අනෙකුත් විද්‍යාඥයන්ගේ වැඩ කටයුතු පිලිබඳව ඔහු 1950 ගනන්වල දී දැනගත්තේ ය. මානව ප්‍රතිජනනයේ විභවය පිලිබඳව වටහාගත් ඔහු, හාවුන්ගේ බීජවලට වඩා වෙනස් වූ මානව බීජ අධ්‍යයනය ඇරඹුවේ මෙහි දී ය. 1963 දී කේම්බ්‍රිජ් සරසවියේ භෞතවේදී අංශයේ තනතුරකට පත් ඔහු අවසානයේ 1969 දී මානව බීජයක් පරීක්ෂන නලයක් තුල සාර්ථකව සංසේචනය කලේ ය.

බීජය තනි සෛල කාන්ඩයකින් ඔබ්බට වර්ධනය නො වීම පිලිබඳව එඩ්වර්ඩ්ස්ගේ උපකල්පනය වූයේ, ඩිම්බයෙන් ඉවත් කිරීමට පෙර මේරීමට ඉඩ හැරි බීජවලට නො නැසී පැවතීමට වැඩි අවස්ථාවක් ඇති බවයි. නාරිවේදියකු ලෙස කටයුතු කල පැට්රික් ස්ටෙප්ටෝ, ඩිම්බාධාර පරීක්ෂා කිරීමට ඉඩ සැලසෙන ලැපරොස්කොපි නමින් හඳුන්වන දර්ශනගත විද්‍යාත්මක උපකරනයක් සමගින් නිරීක්ෂනය කල හැකි ප්‍රකාශ තන්තුමය තාක්ෂනයක් යොදාගැනීමට මූලිකත්වය ගත් බව ඔහු දැනගත්තේ ය.

සෛල මාධ්‍යයෙන් බීජ උපුටා ගැනීම සඳහා සිය තාක්ෂනය භාවිතා කිරිමට ස්ටෙප්ටෝ එකඟ වීම නිසා එඩ්වර්ඩ්ස්ට ශුක්‍රානු එකතුකල හැකි විය. බෙදීම් කිහිපයක් සහිත බීජ සංසේචනය කිරීමේ දී ඔවුහු සාර්ථක වූහ. බීජ අදාල උෂ්නත්ව මට්ටමේ රඳවා ගැනීමට සිය ශරීර උෂ්නත්වය භාවිතා කරමින් ඔල්ධාම් සිට කේම්බ්‍රිජ් දක්වා දුම්රියෙන් බීජ ගෙනගිය ආකාරය පසුකලෙක එඩ්වර්ඩ්ස් සිහිපත් කලේ ය.

1971 දී එක්සත් රාජධානියේ වෛද්‍ය පර්යේෂන සභාව (එම්ආර්සී) වෙත අයදුම් කරමින් ඔවුන් දෙදෙනා සිය පර්යේෂනයට මූල්‍ය අනුග්‍රහය ලබාගැනීමට උත්සාහ දැරූහ. ඒ සඳහා රාජ්‍ය අරමුදල් ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලැබිනි. එය සිදුවූයේ ඇයි ද යන්න පිලිබඳ හේතු ගනනාවක් මෑත සිදුකල එම්ආර්සී වාර්තා පිලිබඳ අධ්‍යයනයකින් පෙන්වා දෙයි. එම හේතු අතරට එඩ්වර්ඩ්ස් සහ ස්ටෙප්ටෝ සිය කාර්යය පිලිබඳව ආරම්භ කල මාධ්‍ය සාකච්ඡාව සහ වඳ භාවය සඳහා ප්‍රතිකාර කිරීම පිලිබඳව පලවූ සදාචාරාත්මක සහ ආගමික විරුද්ධත්වය කෙරෙහි ඔවුන් කල අභියෝගය ගැන එම්ආර්සී යේ "දැඩි නොඑකඟතාවය" අයත් වේ. එම්ආර්සී ඒ සමයේ ජනගහන වර්ධනය අඩුකිරීමේ ආන්ඩුවේ ප්‍රතිපත්තිය මෙන් ම එඩ්වර්ඩ්ස් සහ ස්ටෙප්ටෝ "වෛද්‍ය සංස්ථාපිතයට" අයත් නො වීම ගෙනහැර දැක්වීය: "කේම්බ්‍රිජ් සරසවියෙන් පැමිනියත් එඩ්වර්ඩ්ස් වෛද්‍ය ක්ෂේත්‍රයේ සුදුසුකම් ලබා හෝ තවමත් මහාචාර්යවරයෙක් නොවූ අතර ස්ටෙප්ටෝ, පැමිනියේ උතුරේ කුඩා රෝහලකිනි."

පුද්ගලික පරිත්‍යාගයක් ලෙස සිය පර්යේෂනයට අරමුදල් සොයාගැනීමට එඩ්වර්ඩ්ස් සහ ස්ටෙප්ටෝ සමත් වූ අතර 1978 වනවිට දරුවෙකු ලබාගැනීම සඳහා වසර නවයක් තිස්සේ උත්සාහ දරා අසාර්ථකව සිටි ලෙස්ලි සහ ජෝන් බ්‍රවුන් යුවල ඔවුන්ගේ සායනයට පැමිනි විට ප්‍රථම සාර්ථක අයිවීඑෆ් නලදරු ප්‍රතිකාරය සිදුකිරීමට ඔවුහු සමත් වූහ. 2008 වසරේදී අයිවීඑෆ් තාක්ෂනයේ 30 වසරක සංවත්සරය සැමරූ අවස්ථාවේ කතාකල එඩ්වර්ඩ්ස්, මාධ්‍ය විසින් ලෙස්ලි ලුහුබැඳ තිබුනු බවත් ඇයට සිය දරුවා අහිමි වේ යන බියෙන් පැට්රික් ස්ටෙප්ටෝට ඇය සඟවා තැබීමට සිදුවුනු බවත් විස්තර කලේ ය.

ඔවුන්ගේ ඒකාබද්ධ කර්තව්‍යය පිලිබඳ අදහස් දැක්වූ එඩ්වර්ඩ්ස්, "ජීවිතයේ වැදගත් ම දෙය දරුවෙකු ලැබීම" බව කියා සිටියේ ය. "දරුවෙකු තරම් කිසිවක් සුවිශේෂී නැත. දරුවෙකු ලැබීම අත්‍යවශ්‍යව සිටි ජෝඩුවලට දැනුනු බලාපොරොත්තු කඩවුනු ස්වභාවය දැකීමෙන් ස්ටෙප්ටෝත් මමත් බෙහෙවින් කම්පාවට පත්වුනෙමු. බොහෝ දෙනෙක් අප විවේචනයට ලක් කලත් අපේ රෝගීන් වෙනුවෙන් අපි කරදර මධ්‍යයේ සටන් කලා..."

සිය සාර්ථකත්වය මධ්‍යයේ වුවත් එක්සත් රාජධානියේ ජාතික සෞඛ්‍ය සේවාවේ සහයෝගය ලබාගැනීමට අසමර්ථ වූ එඩ්වර්ඩ්ස් සහ ස්ටෙප්ටෝ කේම්බ්‍රිජ් ආසන්නයේ බෝන් හෝල් සායනයේ පුද්ගලික අරමුදල් මත වැඩ කරන මධ්‍යස්ථානයක් ආරම්භ කලහ. ස්ටෙප්ටෝ ඔහුගේ මරනය දක්වා ම එහි වෛද්‍ය අධ්‍යක්ෂකවරයා වූ අතර විශ්‍රාම ලබන තෙක් එඩ්වර්ඩ්ස් එහි පර්යේෂන අංශ ප්‍රධානියා විය. ලොව පුරා නාරිවේද වෛද්‍යවරුන් සහ ජීව විද්‍යාඥයන් පුහුනු කරන මධ්‍යස්ථානයක් බවට එය පත්විය.

අයිවීඑෆ් තාක්ෂනයේ මුල්ම සාර්ථකත්වයන් වටා තිබූ ප්‍රසිද්ධිය වැඩි වත්ම, විවේචනයන් ද දැඩි විය. උදාහරනයක් ලෙස මානව කලල සංසේචනය, නිල වසයෙන් අනුමත කාල පරාසය තුල සිදු කෙරුන ද සංසේචිත මානව කලල මත සිදු කරන පර්යේෂන මගින් ඔවුන් "මිනිසුන්ගේ මරනය සිදු කිරීමට උදව් කරන්නේ" යයි චෝදනා කරමින් එඩ්වර්ඩ්ස්ගේ පර්යේෂන කන්ඩායම උසාවි ගෙන ඒමට 1984 දී ගබ්සා විරෝධී කල්ලියක් උත්සාහ කලේ ය.

කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව සිය කටයුතු කරගෙන යන්නේ යයි විද්‍යාඥයන්ට චෝදනා කල තාක්ෂන විරෝධී උද්ඝෝෂනයේ යෙදී සිටි ජෙරමි රිෆ්කින්ගේ ප්‍රහාරයට ලක්වූ එක් අංශයක් වූයේ, මානව වඳ භාවය පිලිබඳ පර්යේෂන ක්ෂේත්‍රයයි, ඔහු "අමනෝඥ" විද්‍යාත්මක පර්යේෂන වැලැක්වීමේ උත්සාහය වෙනුවෙන්

වෘත්තීය සමිති, පල්ලි, වෙනත් ආගමික කන්ඩායම් සහ සත්ව හිමිකම් සංවිධාන එක්රැස් කලේ ය. "ෆ්රැන්කන්ස්ටයින්" භීෂන කතාවලට පහසුවෙන් අවුස්සාලීම් කල හැක්කේ කෙසේදැයි යන්න පිලිබඳව සංවේදී වූ ස්ටෙප්ටෝ සහ එඩ්වර්ඩ්ස්, අයිවීඑෆ් පර්යේෂන සඳහා මගපෙන්වීම් නිර්දේශ නො කිරීම පිලිබඳව ආරම්භයේ පටන් ම සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විවේචනයට ලක්කොට තිබුනි. "පීඩනය යොදන කන්ඩායම් ප්‍රචන්ඩ ලෙස විද්‍යාව මත පාලනයක් ඇති කිරීමේ සැබෑ අන්තරායක් පවතී" යයි ප්‍රකාශ කරමින් 1988 පලකල නිවේදනයක් මගින් එඩ්වර්ඩ්ස් විද්‍යා විරෝධී උද්ඝෝෂනවලට ප්‍රතිචාර දැක්වීය.

පසුගිය දශක තුන පුරා අයිවීඑෆ් ශිල්පීය ක්‍රම සංවර්ධනය හා අභිවර්ධනය පිලිබඳ අවස්ථා ගනනාවක් අත්දැක ඇත. උදාහරනයක් ලෙස ශුක්‍රානු ප්‍රමානය ඉතා අඩු අවස්ථාවල දී බීජයක කේන්ද්‍රයට තනි ශුක්‍රානුවක් එන්නත් කිරීමේ හැකියාව දැන් පවතී.

මෙම ශිල්පී ක්‍රම සහ එඩ්වර්ඩ්ස්ගේ ප්‍රතිපදානයන්ට ස්තුති වන්නට බොහෝ දියුනු රටවල අලුත් දරු උපත් වලින් සියයට දෙකත් තුනත් අතර ප්‍රමානයක් අයිවීඑෆ් තාක්ෂනය උපයෝගී කර ගන්නේ යයි තක්සේරු කෙරේ. එහෙත් දියුනු රටවල පවා මෙම ප්‍රතිකාරය අවශ්‍ය කරන ජෝඩුවලට එය ලැබිය නො හැක්කේ ආන්ඩුවල අනුග්‍රහය නො ලැබීම නිසා ය. මෑත පලකල සමීක්ෂනයකට අනුව ආසන්න වසයෙන් ඉල්ලුම තෘප්ත කලහැකි ප්‍රතිකාර පවතින්නේ ඕස්ට්‍රේලියාවේ සහ ස්කැන්ඩිනේවියානු රටවල පමනක් වන අතර එක්සත් ජනපද මධ්‍යම ආන්ඩුව අයිවීඑෆ් සඳහා අරමුදල් යෙදවීමට මැලිවන තතු යටතේ ප්‍රතිකාර සඳහා වන ඉල්ලුමෙන් සපුරාලන්නේ සියයට 24ක් පමනි.

සිය ජීවිතකාලීන ආයාසයන්ට නෙබෙල් ත්‍යාගය මගින් අවධානය ලැබී ඇතැයි නිසැකව ම සතුටුවනු ඇති එඩ්වර්ඩ්ස්, තවමත් පවතින ආගමික ආධානග්‍රාහය සහ අයිවීඑෆ් සඳහා ආන්ඩුවල අනුග්‍රහය මඳ වීම ඉස්මතු කලේ ය. ඔහු සමග වැඩකල අය, ඔහු වනාහි, තමන්ගේ කර්තව්‍යයට මිස තමන්ට පුද්ගලික ප්‍රසිද්ධිය නො සෙවූ නිස්කලංක සහ ලජ්ජාශීලී පුද්ගලයෙකු යයි විස්තර කරති. තමා "උග්‍ර වාමාංශික සමාජවාදියෙකු" ලෙස සලකන ඔහු, තම පර්යේෂන වෙනුවෙන් සාමි පදවියක් ලැබීමට කැමැත්තක් නොදක්වතැයි උපුටා දක්වනු ලැබේ. ඊට අමතරව ඔහු විහිලුවට මෙන් ප්‍රකාශ කර සිටියේ "කොහොම වුනත් ඔබ නොබෙල් ත්‍යාගයක් ලැබීමට සමත් වීනම් කරුනාකර ඉදිරියටම යන්න" යනුවෙනි.

© www.wsws.org